# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No | ඔබේ අංකය<br>உமது இல.<br>Your No | දිනය<br>திகதி<br>Date 2024.06.12 |

පැමිණිලි පාර්ශවය : ආර්.ජේ.එන්.කුරේ මිය,
අංක 75/3, කැළණිමුල්ල,
අංගොඩ.

වගඋත්තරකරුවන් : පො.ප. ආර්.සී.හෙට්ටිආරච්චි මහතා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මුල්ලේරියාව.

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/1936/18</u>**

<u>පැමිණිල්ල:-</u>

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, නිවසට යාමට ඇති පාර සම්බන්ධයෙන් ඇති වූ ගැටළුවක් පිළිබඳව වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට කරන ලද පැමිණිලි වලින් පසුව පොලිසිය විසින් 1979 අංක 44 දරණ ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ ගොනු කරන ලද නඩුවේ 2006.11.09 දිනැති තීන්දුවට අනුව අදාළ පාරේ භුක්තිය පැමිණිලිකාරිය වෙත ලැබී තිබූ බවයි. එසේ අධිකරණ තීන්දුවක් මගින් එම පාරේ භුක්තිය පැමිණිලිකාරිය වෙත ලබාදී තිබියදී එම පාර පාවිච්චි කරන අනෙක් පාර්ශවය විසින් කරන ලද පැමිණිල්ලකට අදාළව කිසිදු විමර්ශනයක් නොකර පැමිණිලිකාරියට පමණක් 81 වන වගන්තිය යටතේ 2018.03.08 වන දින නඩු පැවරීම තුළින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි.

පැමිණිලිකාරිය පැමිණිල්ල සනාථ කිරීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ මුල්ලේරියාව පොලිස් ස්ථානය විසින් ගොනු කරන ලද 89892/18 දරණ නඩුවේ නියෝගයේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, වැල්ලම්පිටිය පොලිසිය විසින් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ ගොනු කර ඇති අංක 93525/02 දරණ නඩුවේ තීන්දුවේ පිටපතක් ද ඉදිරිපත් කර ඇත.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්.ඒ.ද මෙල් මාවත, කොළඹ-04. / இல.14, ஆர்.ஏ.டி.மெல் மாவத்தை, கொழும்பு-04. / No.14, R.A. De Mel Mawatha, Colombo-04.
සභාපති / தவிசாளர் / Chaiman: 011-2505551
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / Email: sechrcsl@gmail.con
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hresl.lk

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

වගඋත්තර පාර්ශවය විසින් 2018.09.16 දිනැතිව මෙම පැමිණිල්ලට අදාළව වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර එම වාර්තාවට අනුව,

2016.11.05 වන දින අංක 75/2, ගඟ අසබඩ පාර, කැළණිමුල්ල, අංගොඩ යන ලිපිනයේ පදිංචි කේ.ඒ.ඒ.නන්දා යන අය CIB II 100/43 යටතේ බැණ තර්ජනය කිරීමේ චෝදනාව යටතේ පැමිණිලිකාරියට විරුද්ධව පැමිණිල්ලක් කර ඇති බවත්, එම පැමිණිල්ල දෙපාර්ශවය කැඳවා සමථයට පත් කර ඇති බවත් දක්වා ඇත.

2017.05.19 දින අංක 75/5, ගඟ අසබඩ පාර, කැළණිමුල්ල ලිපිනයේ පදිංචි තනුජා දිල්රුක්ෂි යන අය CIB I 361/244 යටතේ පැමිණිලිකාරියට විරුද්ධව බැණ තර්ජනය කිරීමේ චෝදනාව යටතේ පැමිණිල්ලක් කර ඇති බවත්, දෙපාර්ශවය කැඳවා සමථ කර ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

2017.10.15 දින CIB ii 75/158 යටතේ අංක 75/4, කැළණිමුල්ල, අංගොඩ ලිපිනයේ පදිංචි ගුණවර්ධන හේවගේ දොන් දර්ශි රංගනා හේරත් යන අය විසින් මෙම පැමිණිලිකාරියට විරුද්ධව බැණ තර්ජනය කිරීමේ චෝදනාව යටතේ පැමිණිල්ලක් කර ඇති බවත්, එම පැමිණිල්ල දෙපාර්ශවය කැඳවා සමථයකට පත් කර ඇති බවත් දක්වා ඇත.

2017.10.29 වන දින මෙම පැමිණිලිකාරියට විරුද්ධව ඉහත ලිපිනයේම පදිංචි හේරත් මුදියන්සේලාගේ ඉසුරු උදයංග යන අය නඩුවක් පවතින මාර්ගයේ වටරවුමේ අනවසර ඉදි කිරීමක් කර ඇති බවට චෝදනා කරමින් පැමිණිල්ලක් කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවය ස්ථානයට කැඳවා සිවිල් අධිකරණයේ නඩු පවරා ගන්නා ලෙසට උපදෙස් දී සමථ කර ඇති බවද වාර්තා කර ඇත.

තවද, 2018.03.01 වන දින අංක 75/2, ගඟ අසබඩ පාර, කැළණිමුල්ල, අංගොඩ යන ලිපිනයේ පදිංචි කේ.ඒ.ඒ.නන්දා යන අය CIB II 219/08 යටතේ බැණ තර්ජනය කිරීමේ චෝදනාව මත පැමිණිලිකාරියට විරුද්ධව පැමිණිල්ලක් කර ඇති අතර, දෙපාර්ශවය කැඳවා සාමයෙන් සිටින ලෙසට උපදෙස් දී සමථ කර ඇති බවද දක්වා ඇත.

2018.03.02 දින අංක 75/2 ඩී, ගඟ අසබඩ පාර, කැළණිමුල්ල, අංගොඩ ලිපිනයේ පදිංචි බී.රත්නසිරි යන අය නිවස අසල පාර අයිනේ වාහනයක් නතර කර ඇති අවස්ථාවලදී පැමිණිලිකාරිය ආරවුල් ඇති කරගන්නා බවටත් නිවස අසල සියළු දෙනා සමඟ ආරවුල් ඇති කර ගන්නා බවටත්, පැමිණිලිකාරියට විරුද්ධව ප්‍රකාශයක් සිදුකර ඇති බව ප්‍රකාශ කර ඇත. ඊට අමතරව එදිනම අංක 75/2 බී, කැළණිමුල්ල, අංගොඩ ලිපිනයේ පදිංචි ආර්.ඩබ්ලිව්.බී.චන්ද්‍රා යන අය විසින් ඇයගේ නිවස අසල මාර්ගය අයිනේ ත්‍රිරෝද රථයක් නතර කර තිබෙන අවස්ථාවේදී පැමිණිලිකාරිය සහ ඇයගේ ස්වාමිපුරුෂයා විසින් එම රියදුරාට වැදුණු බවටත්, අසල නිවෙස් වල අයවළුන් සමඟ නිතර අරවුල් ඇතිකර ගන්නා බවටත්, ඇසෙන බවට ප්‍රකාශ කරමින් ප්‍රකාශයක් ලබාදී ඇති බව ද සඳහන් කර ඇත.

තවද, වගඋත්තරකරු කොමිෂන් සභාවේ පරීක්ෂණ අවස්ථාවේදී වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, දෙපාර්ශවය අතර පාරක් සම්බන්ධයෙන් ආරවුලක් පවතින බවත්, එම ආරවුල සම්බන්ධයෙන් දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත්, ඒ සඳහා ගරු අධිකරණයෙන් නියෝගයක් ලබාගන්නා තෙක් දෙපාර්ශවයට සාමයෙන් සිටින ලෙසට උපදෙස් ලබාදී තිබියදී මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය විසින් ත්‍රිවිල් රථයක් පාරේ නවතා ඇති බවට පැමිණිල්ලක් කර තිබූ බවත්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර එම ත්‍රිවිල් රථය කුලී ත්‍රිවිල් රථයක් බවට හඳුනාගත් බවත්,මෙම ගැටළුව සම්බන්ධයෙන් දිගින් දිගටම සාමය කඩවන බැවින්, වගඋත්තරකරුවන් විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ අළුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 08 අධිකරණයේ නඩුවක් ගොනු කළ බවත්, මෙම පැමිණිලි පාර්ශවය කිසිදු අවස්ථාවක නීතිඥ මහතෙකු ඉදිරිපත් නොකළ බවත්ය.

එසේම එහිදී මෙම පාර සම්බන්ධයෙන් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ නඩුවක් ඇති බවට කරුණු ඉදිරිපත් නොකළ බවත්, මෙම මාර්ගය පාවිච්චි කරන අනෙක් සියළු නිවෙස් හිමියන් මෙම පැමිණිලිකාරියට විරුද්ධව පැමිණිලි 05 ක් ගොනු කර ඇති බවත්ය.

තවද, මෙම පාර සම්බන්ධයෙන් දිසා අධිකරණයේ නඩුවක් විභාග වන බැවින් ද, ඒ අතරතුරදී සාමය කඩවීම තුළින් බරපතල තත්ත්වයක් ඇතිවීම වැළැක්වීම සඳහා 81 වන වගන්තිය යටතේ නඩුවක් ගොනු කිරීමට කටයුතු කළ බවයි.

**නිරීක්ෂණ :-**

ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 93525/02 යටතේ පැවති නඩුවේ 2006.11.09 දිනැති තීන්දුවට අනුව, ප්‍රශ්නගත මාර්ගයේ භුක්තිය පැමිණිලිකාරිය සතු බවත්, එම භුක්තිය අවහිර කරන කිසිදු කටයුත්තක් අනෙක් පාර්ශවය විසින් නොකළ යුතු බවටත් නියෝග කර ඇති බවට නිරීක්ෂණය වන අතර, මෙම මාර්ගය සම්බන්ධයෙන් අනෙක් පාර්ශවය විසින්ද පැමිණිලිකාරියට විරුද්ධව දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවද නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීමට අනුව, පැමිණිලිකාරියට විරුද්ධව පැමිණිලි 05 ක් ගොනු කර ඇති අතර, එම පැමිණිලි වලින් 2016, 2017 සහ 2018 වසරවලදී සිදුකර ඇත. මෙම තත්ත්වය යටතේ බරපතල සාමය කඩවීමක් සිදුවිය හැකි බවට සඳහන් කරමින් වගඋත්තරකරු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ පැමිණිලිකාරියට විරුද්ධව පමණක් නඩු ගොනු කර ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් මෙම පාරේ ආරවුල සම්බන්ධයෙන් අනෙක් පාර්ශවයට විරුද්ධව මුල්ලේරියාව පොලිස් ස්ථානයේ පහත සඳහන් පරිදි පැමිණිලි 19 ක් පමණ ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වන අතර, ඒ අනුව පැමිණිලි පාර්ශවයට පමණක් 81 වගන්තිය යටතේ නඩු පැවරීම තුළින් වගඋත්තරකරුවන් පක්ෂග්‍රාහීව කටයුතු කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

මෙහිදී විසඳිය යුතු ප්‍රශ්නය වනුයේ, මෙම මාර්ගයේ ආරවුල සම්බන්ධයෙන් පොලිසියට ලද පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් නිසි විමර්ශනයක් සිදුකරන ලද්දේ ද යන්න සහ පැමිණිලිකාරිය විසින් අනෙක් පාර්ශවයන්ට විරුද්ධව පැමිණිලි 19 ක් කර තිබියදී, දෙපාර්ශවයේ පැමිණිලි නිසි විමර්ශනයකට ලක් කළේද යන්නත්, පැමිණිලිකාරියව පමණක් විත්තිකරුවෙකු වශයෙන් නම් කර අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ නඩුවක් පැවරීම සිදුකලේ කුමන පදනමකින්ද යන්නත් වේ.

තවද, වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරියට විරුද්ධව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ නඩු පැවරීමට පෙර මෙම පාරේ භුක්තිය සම්බන්ධයෙන් ප්‍රාථමික අධිකරණ නඩු විධාන පනතේ 66 වන වගන්තිය යටතේ අධිකරණය විසින් ලබාදී තිබූ නියෝගය වගඋත්තරකරුවන් විසින් පරිශීලනය නොකලේද යන්න පිළිබඳව සහ මීට අදාළව දිසා අධිකරණයේ පවතින නඩුව සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් නිසි සැළකිල්ලක් යොමු කළේද යන්න පිළිබඳ ගැටළුවක් මතුවේ.

එසේම, අනෙක් පාර්ශවයන්ට විරුද්ධව පොලිසියට සිදුකරන ලද පැමිණිලි සම්බන්ධයෙන් පොලිසිය විසින් සැළකිලිමත් නොවූයේ මන්ද යන්න ගැටළුකාරි වේ.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් අදාළ පැමිණිලි සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදුකර නැති බවට කොමිෂන් සභාවට පෙනියන අතර, පැමිණිලිකාරියට විරුද්ධව පමණක් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ නඩු පැවරීම තුළින් පැමිණිලිකාරියට අගතියක් සිදු වී ඇති බවට පෙනියයි. එසේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 81 වන වගන්තිය යටතේ පවරන ලද අංක 89892/8/18 නඩුවේදී ගරු විනිශ්චයකාරතුමන් විසින් තම නියෝගයේ ඒ බව මනා ලෙස පැහැදිලි කර ඇත. එනම්, පැමිණිලිකාරියට විරුද්ධව සිදුකරන ලද පැමිණිලි වල සත්‍ය අසත්‍යතාවය වගඋත්තරකරු විසින් විමර්ශනය කර ඇත්ද යන්න පිළිබඳව ගරු විනිශ්චයකාරතුමා විසින් ද තම මතය පැහැදිලි කර ඇත. එනම්, වගඋත්තරකරු විසින් අදාළ පැමිණිල්ලේ කරුණු වල සත්‍ය අසත්‍යතාවය පිළිබඳව නිසි විමර්ශනයක් කර නැති බවත්, පැමිණිලිකාරියට විරුද්ධව සිදුකරන ලද පැමිණිලි වල ආසන්නම සිදුවීම සිදුවූ දිනය වන 2018.03.02 දින මෙම පැමිණිලිකාරිය ද අනෙක් පාර්ශවයට විරුද්ධව පැමිණිල්ලක් කර ඇති බවත්, එම පැමිණිල්ල සම්බන්ධයෙන් ද අදාළ නඩුවේදී කරුණු වාර්තා කර නොමැති බවත් දක්වා ඇත.

ඒ අනුව වගඋත්තරකරු විසින් නිසි විමර්ශනයක් නොකර අපරාධ නඩු විධාන සංග්‍රහයේ කාර්ය පාටිපාටියට බැහැරව කටයුතු කිරීම තුළින් පැමිණිලිකාරියගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

01. වගඋත්තරකාර පො.ප ආර්.සී හෙට්ටිආරච්චි යන අය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුය.

02. වගඋත්තරකාර ස්ථානාධිපති පො.ප ආර්.සී හෙට්ටිආරච්චි යන අය විසින් පැමිණිලි පාර්ශවය වෙත රු. 5,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2024. 07 . 16 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. අධ්‍යක්ෂ,
මානව හිමිකම් කොට්ඨාශය,
එන්.එම් පෙරේරා මාවත,
කොටා ටෙරස්, කොළඹ 08.
} අදාළ නිලධාරීන්ගේ නව සේවා ස්ථාන වෙත නිර්දේශය යොමු කිරීමට

B/